පාර්ලිමේන්තුවේ පුස්තකාලය
22 AUG 1995

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1995 අංක 9 දරන
# ඉඩම් සංවර්ධන (සංශෝධන)
# පනත

---

[සහතිකය සටහන් කළේ 1995 ජූනි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1995 ජූනි මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
**ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : ශත 30 යි.    තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

# 1995 අංක 9 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1995 ජූනි මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 55/94

**ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1995 අංක 9 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "දිසාපතිවරයා විසින්" යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **464 වන අධිකාරයේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.**

> "දිසාපතිවරයා විසින් ඊට අතිරේක වශයෙන්, අවසර පත්‍රය ලියාපදිංචි කිරීමට සැලැස්විය යුතු ය ; ඒ ලියාපදිංචි කිරීම සඳහා කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබිය යුතු ය; නැතහොත් අයකර ගනු නොලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. **ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය ඉවත් කිරීම.**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

> "අන් සතු කරනු ලැබූ ඉඩමේ විස්තරයක් ප්‍රදාන පත්‍රයෙහි ඇතුළත් විය යුතු බව.
>
> 30. ඉඩමක් අන් සතු කරනු ලබන සෑම ප්‍රදාන පත්‍රයක ම, ඒ ඉඩමේ ප්‍රමාණය සහ මායිම් පිළිබඳ විස්තරයක්, ඇතුළත් විය යුතු ය.".

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. **අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන
එක් එක් වර්ෂය සඳහා ගිවිස ලබාගත හැකිය.